# ඔක්තෝබර් මස 19 හා 20 යන දෙදින පැවැත්වීමට නියමිත අප පක්ෂයේ ජාතික සම්මේලනයට මධ්‍යම කාරක සභාව විසින් ඉදිරිපත් කරන දේශපාලන යෝජනාවේ කෙටුම්පතයි.

1 ලාංකේය සමාජය වර්තමානයේ මුහුණදෙන අර්බුදය මීට පෙර පැවැති තත්වයන්ට වඩා හාත්පසින්ම වෙනස් හා සංකීර්ණ තත්වයකි. බලය ලබාගැනීම සඳහා ප්‍රධාන ධනපති දේශපාලන පක්ෂ අතර සිංහල බෞද්ධ ජනතාව රැවටීම සඳහා කරනුලැබූ මැදිහත්වීම් 1948දී නිදහස ලබා ගැනීමේ කාලයේ සිටම දැකිය හැකි වුවද රාජපක්ෂ රෙජිමය මෙන් සිංහල ජාතිවාදය රාජ්‍ය පාලනයේප්‍රධාන සාධකය කර ගැනීමට ඔවුන් කටයුතු කළේ නැත. එහෙත් මේ වන විට අප අත් දකිමින් සිටින්නේ රාජපක්ෂ පාලනය සිංහල බෞද්ධ අධිපති මතවාදය රාජ්‍ය පාලනයේ කේන්ද්‍රිය සාධකයක් ලෙස යොදාගෙන තිබෙන අන්දමය. 2005 දී මහින්ද රාජපක්ෂ බලයට පැමිනෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ හා සිහළ උරුමය සමඟ සකස් කර ගත් සිංහල බෞද්ධ ව්‍යාපෘතිය මුලික කරගත් දේශපාලන වැඩ පිළිවෙලක් සමගින්ය. උතුරේ දෙමළ ජනතාවට එරෙහි ව්‍යාපාරයක් ලෙස වර්ධනයවූ එම වැඩ පිලිවෙල ඉන් ඔබ්බට ගොස් රාජපක්ෂගේ සන්ධානයට එරෙහි සියලු දේශපාලන පක්ෂ හා පුද්ගලයන් දේශද්‍රෝහීන් බවට හංවඩු ගසන තත්වයක් රටතුළ නිර්මාණය කර ගන්නා ලදි. එම ව්‍යාජය දකුණේ සිංහල ජනතාව තුළ තහවුරු කිරීම සඳහා එතෙක් ජවිපෙ රඟ දක්වනු ලැබූ ඊනියා මාක්ස්වාදී සළුපිළි ගලවා දමා සිංහල ජාතිවාදී හා ධනපති පාලනයේ සෘජු කොටස්කරුවන් බවට පත්විය. ඒ සඳහා මහින්ද රාජපක්ෂ නූතන දුටුගැමුණු වශයෙන් හඳුන්වා දෙනු ලැබූ අතර දෙවන මහින්දාගමනයක ආරම්භය යනුවෙන්ද අර්ථ ගන්වන ලදී.

2 ඉන් අනතුරුව 2009 යුද්ධ ජයග්‍රහණය සිංහල බෞද්ධ රාජ්‍ය තහවුරු කර ගැනීම සඳහා විශාල අවකාශයක් නිර්මාණය කර දෙන ලදි. ජවිපෙය ඇතුලු සියලු ජාතිවාදී බලවේග එය දෙමළ ජනතාවගේ පරාජයක් යන අර්ථය තහවුරු කිරීම සඳහා නොකළ දෙයක් නැති තරම්ය. මේ හරහා 2010 ජනාධිපතිවරණය විශාල ප්‍රතිශතයකින් ජයග්‍රහනය කර ගැනීමට අවශ්‍ය පදනම ඒ වන විට මහින්ද රාජපක්ෂ විසින් නිර්මාණය කරගෙන තිබුණි. එසේ වුවද 2010 දක්වා රාජපක්ෂගේ ආණ්ඩුව පාර්ලිමේන්තුව තුල පැවැතියේ 2004දී චන්ද්‍රිකාගේ නායකත්වයෙන් දිනාගත් සුළු ජන්ද සංඛ්‍යාවකින් පවත්වාගෙන ගිය ආණ්ඩුවක් වශයෙනි. ඉන් අනතුරුව 2010 අප්‍රේල් මහ මැතිවරණය පැවැත්වුයේ යුද්ධයේ වීරයා ලෙස ජනාධිපතිවරණයේදී ලබාගත් විශාල ජයග්‍රහණයක උනුසුම සමගිනි. මෙතෙක් බලයේ සිටි නායකයෙකුට නොතිබූ තරම් අති විශාල ජනප්‍රිය නායකයකු ලෙස මහ මැතිවරණය පැවැත්වුවද රාජපක්ෂ බලාපොරොත්තුවූ අන්දමේ තුනෙන් දෙකක (2/3) බලයක් ලබාගැනීමට නොහැකි විය.

3 මහ මැතිවරණයෙන් තමන්ට නොලැබුණු 2/3 පාර්ලිමේන්තු බලය ලබා ගැනීම සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරු මිලදී ගැනීමට රාජපක්ෂ වහාම පියවර ගනු ලැබුවේ සිය ඒකාධිපති ගමන් මග ව්‍යවස්ථානුකූලව තහවුරු කර ගැනීමට එය අවශ්‍යවූ හෙයිනි. යුද්ධ ජයග්‍රහණයෙන් ලබාගත් ජනප්‍රියතාවය හීනවන්නට පෙර තමන්ට ඕනෑම කාලයක් ජනාධිපතිධුරයේ රැඳී සිටීම සඳහා (මෙයට පෙර ව්‍යවස්ථාවෙන්වාර දෙකකට සීමාකර තිබූ ජනාධිපතිධුරය) නායකත්වයෙන් 18 වන ව්‍යවස්ථා සංශෝධනය හදිසි පනතක් ලෙස එක් දිනකදී 2/3 බහුතරය පාවිච්චි කර සම්මත කරගන්නා ලදී. සාමාන්‍යයෙන් විධායක ජනාධිපතිධුරයේ දෙවන වාරයේ අවසාන භාගය වන විට තමන්ගේම පක්ෂය තුලින් ඊළඟ ජනාධිපති විය හැකි නායකයා වටා පෙළගැසීම වලක්වා නායකත්වයෙන් ගිලිහී යන බලය තමන් අත සදාකල් තබා ගැනීමටද රාජපක්ෂ කටයුතු කළේ එක ගලෙන් කුරුල්ලන් දෙදෙනෙකු මරා දැමුවාසේය. ඒ අනුව ලාංකේය සමාජය වර්තමානයේ අත්දකින්නේ ව්‍යවස්ථාදායක ඒකාධිපතිත්වයක් කරා තහවුරු කර ගනිමින් යන්නාවු මින් පෙර නොපැවති අන්දමේ රාජපක්ෂ පවුල් පාලනයකි.

4 විධායක ජනාධිපති ක්‍රමය තුළ අන්තර්ගතව පවතින ඒකාධිපති බලතල ප්‍රායෝගික අර්ථයෙන් රාජපක්ෂ පවුල තුල කේන්ද්‍රගත කර පවත්වාගෙන යාම මෙහි තවත් විශේෂත්වයකි. විධායකය හා ව්‍යවස්ථාදායකය යන දෙකම (අධිකරණයද මේ වන විට රාජපක්ෂ වරුන්ගේ අණසකට යටත්කර ගෙන ඇත.) තම අණසක යටතේ පවත්වාගෙන යෑම සඳහා මීට පෙර පැවැති ධනපති ආණ්ඩුවලට නොතිබූ අයුරින් බලය දැඩිලෙස ඒකාග්‍රකර ගෙන ඇත. විශේෂයෙන් මුදල් හා ආරක්ෂක අමාත්‍යංශ දෙකම ජනාධිපති ලෙස තමන් යටතේ පවත්වා ගනිමින් ඊට නියෝජ්‍ය ඇමතිවරයෙකු වත් පත් නොකර ආරක්ෂක ලේකම්ධුරය තම සොහොයුරා වෙත පවරා දෙමින් ආරක්ෂක අංශ හැසිරවීමේ අසීමිත බලය රාජපක්ෂ පවුල තුල කේන්ද්‍රගත කර ගෙන තිබේ. 2009 වසරේ යුද්ධය අවසන්වීමෙන් පසුව සෑම වසරකම ආරක්ෂක වියදම් විශාල ලෙස ඉහලනංවා ඇත. (මේ වසරේ ආරක්ෂක වියදම රු.බිලියන 290කි - යුද්ධ කාලයේ එම සංඛ්‍යාව රු.බි. 190 විය.)

5 පවුල් පාලනය කොයිතරම් ප්‍රමාණයකට ආර්ථිකය හසුරුවන්නේද යන්න පසුගිය වසරේ වාර්ෂික අයවැයෙන් වැඩිම මුදල් ප්‍රමාණය වෙන්කර ඇත්තේ රාජපක්ෂ පවුල විසින් හසුරුවනු ලබන අමාත්‍යංශයන්

වෙත වෙන් කර ගැනීමෙන් පැහැදිලිවේ. 2013 අයවැයෙන් සමස්ථ වැය ශීර්ෂ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් සියයට 45ක් වෙන්කර ඇත්තේ රාජපක්ෂ පවුලට අයත් අමාත්‍යංශ වෙනුවෙනි. ජනාධිපති ලේකම් කාර්යංශය සඳහා දිනකට වැය කෙරෙන මුදල රුපියල් දශලක්ෂ 20කි. මෙයට අමතරව පාර්ලිමේන්තුවේ කථානායකධූරය තම වැඩිමහල් සහෝදරයා වෙත පවරා පාර්ලිමේන්තුව රාජපක්ෂවරුන්ගේ උවමනාවන් මත හසුරුවන රූකඩ පාර්ලිමේන්තුවක් බවට පත්කර ගෙන ඇත. සියලු අමාත්‍යංශ අභිබවා පාලනය කිරීමේ බලය රාජපක්ෂ පවුලේ අනෙක් සහෝදරයා වන ඇමති බැසිල් රාජපක්ෂ හරහා සිදු කරනු ලබයි. මෙයට අමතරව තම වැඩිමහල් පුත් පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ සියලු අමාත්‍යංශ වල කටයුතු අනියමින් තම අධීක්ෂණය යටතේ හසුරුවනු ලබයි.

6 යුද්ධය අවසන්ව වසර 4කට වඩා වැඩි කාලයක් පසුකර ඇතත් උතුරේ තවමත් පවතින්නේ නිල නොවන හමුදා පාලනයකි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී (UNHRC) ශ්‍රී ලංකා රජයට එරෙහිව සම්මත කරගත් යෝජනා වල බලපෑම මත හා නොවැම්බරයේ පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩල නායක සමුලුව හේතු කොටගෙන උතුරේ හමුදා පාලනයේ මතුපිට ස්වරූපය යම් ප්‍රමාණයකට වෙනස් කර ඇතත් එහි අභ්‍යන්තරයේ හමුදා පාලනයකට අවශ්‍ය සියලු ව්‍යුහයන් නොවෙනස්ව පවත්වාගෙන යති. අකමැත්තෙන් වුවද උතුරේ පළාත් සභාව පොදු රාජ්‍ය මණ්ඩලීය සමුලුවට පෙර පැවැත්වීමට සිදුවීම එහි තවත් පියවරකි. උතුරේ දෙමළ ජනතාවගේ පාරම්පරික වාසභූමියේ දේශපාලන ස්වභාවය වෙනස් කිරීම සඳහා සිංහල ජනතාව හා හමුදා පවුල් පදිංචි කිරීම ඇතුලු පියවරයන් ගණනාවක් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. රාජපක්ෂ පාලනය පදනම් වන දකුණේ සිංහල බෞද්ධ ආධිපත්‍ය උතුරු - නැගෙනහිර පලාත්වල කෘතිම අන්දමට සිංහල ගම්මාන ස්ථාපිත කරමින් දෙමළ භාෂාව කථා කරන ජනතාව (මුස්ලිම් ජනයා ඇතුලත්ව) දෙවන ඝනයේ පුරවැසියන් ලෙස තහවුරු කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

7 විධායක ජනාධිපති ධූරයට ලැබී තිබෙන අසීමිත බලය සීමිත ආකාරයකට හෝ පාලනය කිරීම සඳහා චන්ද්‍රිකාගේ පාලන යුගයේදී පාර්ලිමේන්තුවේදී සම්මත කරගත් 17 වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර 18 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම මගින් විධායක ජනාධිපතිධූරයේ ඒකාධිපති බලය තවත් තහවුරු කර ගන්නා ලදී. ඒ අනුව මේ වන විට මැතිවරණ කොමසාරිස්ගේ සිට පොලිස්පති, මානවහිමිකම් කොමිෂම අල්ලස් හෝ දූෂණ මර්ධන කොමිෂම වැනි ධනේශ්වර ක්‍රමය තුල යම් සීමිත ස්වාධීනත්වයකින් කටයුතු කළ ආයතන හා තනතුරු දරණ පුද්ගලයින් රාජපක්ෂ පාලනයට අවනත අන්දමට කටයුතු කරන තත්වයට පත්කර ගෙන ඇත. ඒ තත්වය තුල රටේ නීතිය හා සාමය සම්පූර්ණයෙන්ම බිඳ වැටුනු අරාජික තත්වයක් නිර්මාණයවී තිබේ. රාජපක්ෂ පාලනයට අවශ්‍ය ලෙස සියලු දෙය සිදුවන තත්වයක් රට අභ්‍යන්තරයේ උදාවී ඇත.

8 හිටපු අගවිනිසුරුවරිය ධූරයෙන් ඉවත් කිරීම සඳහා සාම්ප්‍රදාය විරෝධී ලෙස රාජපක්ෂ පාලනය කඩිමුඩියේ අනුගමනය කළ දැඩි ක්‍රියාමාර්ගය තුලින් ධනේෂ්වර රාජ්‍ය පාලනයේ ප්‍රධාන මුල්ගල් වන විධායකය - ව්‍යවස්ථාදායකය හා අධිකරණය යන ආයතන තුනම රාජපක්ෂවරුන්ට සෘජු ලෙස අවනත කර ගනිමින් අධිකරණය යටත්කර ගැනීම මේ ගමනේ තවත් තීරණාත්මක පියවරක් විය. දිවි නැගුම පනත සම්මත කර ගැනීම සඳහා (ස්ථාපිතකර නොමැති උතුරු පළාත් සභාව ඇතුලත්ව) සියලු පළාත් සභාවල අනුමැතිය අවශ්‍ය බවට හිටපු අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක දුන් තීන්දුව රාජපක්ෂ පාලනය තැති ගැනීමකට ලක් කරන ලදී. ඒ අනුව සීමිත ධනපති ප්‍රජාතන්ත්‍රීය සම්ප්‍රදායන් සියල්ල පවා අමු අමුවේ බිඳ දමා පාර්ලිමේන්තුව තුල තිබෙන 2/3 බහුතර බලය යොදා ගනිමින් හිටපු අගවිනිසුරුවරිය ධූරයෙන් ඉවත් කළේ අධිකරණය තමන්ට අවශ්‍ය අන්දමට හීලෑ කර ගැනීම සඳහාය.

9 මේ අයුරින් හමුදාව හා පොලීසිය මත පදනම් වන රාජපක්ෂ පවුල් පාලනය වටා ගොඩනගන ලද ව්‍යවස්ථාදායක ඒකාධිපතිත්වයක් රටතුල නිර්මාණය කෙරෙමින් පවතී. මෙහි ප්‍රධානතම සාධකය බවට පත්ව තිබෙන්නේ සිංහල බෞද්ධ ජාතිකවාදී අධිපති මතවාදයයි. මෙලෙස ගොඩනගාගෙන තිබෙන සිංහල බෞද්ධ පාලනයේ උරුමක්කාරකම වෙනත් අයෙකුට දීමට රාජපක්ෂ සූදානම් නැත. ජනතා විමුක්ති පෙරමුණ මේ වන විට රාජපක්ෂ පාලනයෙන් වෙන්වී සිටියද මහින්දට ඒකාධිපතිවාදී ගමන යෑම සඳහා ජාතිවාදී පදනම සකස් කිරීම සඳහා තීරණාත්මක වැඩ කොටස ඉටු කරන ලද්දේ ඔවුන් විසිනි. රතු කොඩිය වනා ජනතාව රවටන එහෙත් මාක්ස්වාදය හා කිසිම සම්බන්දයක් නොමැති ජවිපෙයට මහින්ද රාජපක්ෂගේ සිංහල ජාතිවාදී හා ධනවාදී වැඩ පිළිවෙල සමග සංවාසයේ යෙදෙමින් ඔහු බලයට පත් කිරීමට කිසිම හිරිකිතයක් නොවීය. ලාංකීය ධනේෂ්වර දේශපාලන ඉතිහාසය තුළ වෙන කවරදාකවත් නොතිබූ අයුරින් සිංහල බෞද්ධ ස්වෝත්තමවාදය දේශපාලන කරලියට නංවන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණ විසිනි. මේ වන විට ජාතිවාදී බලය බොදු බල සේනා, සිංහල රාවය, රාවණා බලය වැනි සංවිධාන විසින් රාජපක්ෂ පාලනයේ සෘජු මැදිහත්වීම යටතේ තමන් අතට ගෙන කටයුතු කරනුයේ රාජපක්ෂ පාලනය සිංහල ජාතිවාදයේ අයිතිය තමන්ගෙන් වෙනතකට ගමන් කිරීමට ඉඩ නොදීම පාලනය පවත්වාගෙන යාමේ අතිශය වැදගත් කොන්දේසිය බවට පත්ව ඇති හෙයිනි.

## ආර්ථිකයේ ස්වභාවය

10 ආර්ථිකය වර්ධනය වෙමින් පවතින බව මහ බැංකු වාර්තාවලින් ප්‍රකාශ කරන නමුදු සමස්ථයක් ලෙස රටේ ආර්ථිකය පවතින්නේ යහපත් තත්වයක නොවන අතර ආර්ථිකයේ ඉදිරි වර්ධනයන් බරපතල අර්බුදකාරී තත්වයක් නිර්මාණය වන බව පෙන්නුම් කර ඇත. මහා පරිමාණයෙන් ගොඩනගමින් තිබෙන මහා මාර්ග වරායවල් හාගුවන් තොටුපල වැනි මතුපිට තලයේ ප්‍රදර්ශණාත්මකව සිදු කරගෙන යන ව්‍යාපෘති සියල්ල කරනුයේ කෙටිකාලිනව ගෙවිය යුතු අධික පොලියට ලබා ගන්නා ලද විදේශ ණය මුදල් යෙදවීමෙනි. මෙවැනි ආටෝපවාදී කටයුතු කරනු ලබන්නේ සෘජු විදේශ ආයෝජන (FDI) ගෙන්වා ගැනීම සඳහා බව ප්‍රකාශ කළද ආණ්ඩුව බලාපොරොත්තුවූ ඉලක්කවලට ආසන්නවීමටවත් නොහැකිවී ඇත. රටතුල පවතින නීතියේ ආධිපත්‍ය බිඳවැටීම සංචාරකයන් ඝාතනය කිරීම විශාල පරිමාණ දූෂණ හා මංකොල්ලයන්, මාධ්‍ය නිදහස උල්ලංඝනයවීම, වෘත්තිය සමිති මර්ධනය කිරීම, ත්‍රස්තවාදය වැලකැවීමේ පනත යොදා ගනිමින් දෙමළ තරුණයින් හා විරුද්ධ දේශපාලන ක්‍රියාකාරීන් මර්ධනය කිරීම හා පොදුවේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම යන කරුණු නිසා විදේශ ආයෝජකයින් ආකර්ශණය කර ගැනීමට ආණ්ඩුව දරණ උත්සාහය අසාර්ථකවී ඇත.

11 රුපියලේ හුවමාරු අගයේ අනුපාතිකය තමන්ට වාසිදායක ලෙස පවත්වාගෙන යාමට රාජපක්ෂ පාලනය කෘතිම ලෙස යොදාගත් උපක්‍රම අත් හැරීමට සිදුවීම සමග පසුගිය වසර දෙක තුල රුපියලේ අගය ඩොලරයට සාපේක්ෂව සියයට 30 කට ආසන්න ප්‍රමාණයකින් පහත වැටුණි. එයින් රජයේ අයවැය පාලනය කර ගැනිමට නොහැකිවීම හේතු කොට ගෙන කම්කරු පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාව ඇතුලු සමස්ථ ජනතාවටම ඉසිලිය නොහැකි විශාල බරක් කර ගැසීමට සිදුවිය. සියලු අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිල සියයට 40ක ප්‍රමාණයකට වඩා වැඩියෙන් ඉහල දමන ලදි. ජාත්‍යන්තර වශයෙන් ඇමරිකාව ප්‍රමුඛ බටහිර ධනේෂ්වර බලවතුන් ගෙන් මානවහිමිකම් කඩකිරිම සම්බන්දයෙන් එල්ල වන විවේචන ඉදිරියේ රාජපක්ෂ වැඩියෙන් චීන ආධාර මත යැපෙන තත්වයට පත්ව ඇත. චීනය සමග ඇතිකර ගෙන තිබෙන වෙළද හා ආර්ථික ගිවිසුම් හේතු කොට ගෙන ඉන්දිය ධනපති පාලනය ශ්‍රී ලංකා රාජ්‍ය සමග තිබූ සම්බන්ධතාව පලුදුවීමට හේතුවී ඇත. රාජපක්ෂ වරුන්ගේ පුරාජේරුව පවත්වා ගැනිම මුලිකකර ගනිමින් අධික පොලියට ලබා ගන්නා විදේශ ණය රාජපක්ෂ පාලනය විසින් මෙයට පෙර ලබාගත් ණය ගෙවීමට හා පොලී ගෙවීම සඳහා වැය කිරීමට සිදුව ඇත. ගුරුවරුන්, හෙදියන් පිබිකරුවන් ඇතුලු රජයේ සේවකයින්ගේ වැටුප පවා ගෙවා ගැනීමට නොහැකි තත්වයට අර්බුදය උග්‍රවී ඇත. ඕනෑම රටක ආර්ථිකයට සිදුවිය යුතු ඉතා අයහපත්ම තත්වයන් මේ නාස්තිකාර පිළිවෙත නිසා උද්ගතවී ඇත. ආණ්ඩුව කොතෙකුත් වගාඩම්බර දෙසුවද ඉදිරියේ ආර්ථිකයේ ඇතිවිය හැකි යයි අනුමාන කළ හැකි කම්පනයක් තුලින් ලංකාව ආසියාවේ ආශ්වර්ය බවට පත් කිරීම කෙසේ වෙතත් ආසියාවේ ග්‍රීසිය බවට පත්වීමේ ලක්ෂණ පහලවී ඇත.

12 රටේ ආර්ථිකය ගැන ශ්‍රීලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛන වලට අනුව 2012 ආර්ථික වර්ධනය 6.2%කි. (දළ දේශිය නිෂ්පාදිතය -GDP) 2010දී ආණ්ඩුව පුරාජේරු ගැසුවේ සියයට 8ක ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යෑම ගැනය. එහෙත් මේ වන විට එය 6.2 දක්වා පහත වැටී ඇති අතර 2013 ආර්ථික වර්ධනය සියයට 5.5ක පමණ ප්‍රමාණයකටත් වඩා පහත වැටීමට බොහෝදුරට ඉඩ ඇති බව පෙනියයි. අපනයන ආදායම දළ දේශිය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වේගයෙන් පහළ වැටෙමින් පවති. 2000 වසරේදී සියයට 33ක අපනයන ආදායමක් උපයාගත් අතර ප්‍රතිශතයක් වශයෙන් එය 2012 වසර වන විට සියයට 16 දක්වා පහත වැටී ඇත.
ධනේෂ්වර ක්‍රමය තුල නොවැලැක්විය හැකි දූෂණය නාස්තිය හා අකාර්යෂම පාලනය රාජපක්ෂ පාලනය තුල වාර්තා පිහිටුවා ඇති බව නොරහසකි. ඔවුන් විශාල වශයෙන් බලාපොරොත්තු තැබූ හම්බන්තොට වරාය හා හම්බන්තොට මත්තල ගුවන් තොටුපල ආර්ථිකයට උසුලාගත නොහැකි සුදු අලියකු බවට පත්ව ඇත. අප රටේ තේ ආර්ථිකය සීඝ්‍රයෙන් පහල වැටෙමින් පවතින අතර අප රටේ කිලෝවක් නිපදවන වියදමට වඩා අඩුවෙන් කෙන්යාවේ තේ නිපදවයි. GSP සහනය නොමැතිවීම සමග ඇගලුම් කර්මාන්තය දිනෙන් දින අර්බුදයට යමින් කම්කරුවන් තොගපිටින් රැකියාවලින් දොට්ට දමමින් සිටී. ඒ අතර ඇඟලුම් කර්මාන්තය සම්බන්දව ලංකාවට තිබූ තත්වය අභිබවා බංගලා දේශය වැනි රටවල විශාල ප්‍රසාරණයක් සිදුව ඇත. සංචාරක ව්‍යාපාරය කෙරෙහි රාජපක්ෂවරු බලාපොරොත්තු තැබුවද මෙරට සංචාරක හෝටල් ගාස්තුව සාපේක්ෂ වශයෙන් ඉහල මට්ටමක තිබීමද, මානව හිමිකම් කඩ කිරීම් ආණ්ඩුවේ ප්‍රාදේශිය දේශපාලකයින් විසින් සංචාරකයින් දූෂණය කිරීම හා මරා දැමීම වැනි කරුණු හේතු කොටගෙන මැලේසියාව තායිලන්තය හා මාලදිවයින වැනි රටවලට සංචාරකයින් ආකර්ශණය වීමට පටන්ගෙන ඇත.

13 මෙම පසුබිම තුල ආණ්ඩුව කටයුතු කරන්නේ රටේ ආර්ථිකය සුදු පිටියක් බවට පත්කිරීමටය. සිංහල බෞද්ධ ජනතාව රැවටීම සඳහා මේ දිනවල ගව ඝාතනය තහනම් කිරීම ගැන විශාල ප්‍රචාරයක් කරන රාජපක්ෂ ඇණ්ඩුව ධර්ම රාජ්‍යයක් ගොඩනැගීමට දේශපාලනයට අවතීර්ණවූ ජාතික හෙළ උරුමයේද සහයෝගය ඇති රටපුරා සූදුව නිතිගත කිරීම සඳහා සූදු පණත සම්මත කරන ලදි. ලෝක ප්‍රකට ඕස්ට්‍රේලියානු කැසිනෝ ව්‍යාපාරික ජේම්ස් පැකර් (james packer) නැමැති ව්‍යාපාරිකයාට ඩොලර් මි.200ක කැසිනෝ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා කොළඹ නගරයේ විශාල භූමියක් සමග වසර 10ක බදු සහනයක් ප්‍රධානය

කර ඇත. එහෙත් මෙවැනි සුදු ආර්ථිකයකින් රැකියා උත්පාදනයක් සිදු නොවන අතර රටතුල පවතින විරැකියාවට පිළිතුරු නොලැබෙනු ඇත. රුපියලේ අගය ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වීම වලක්වා ගැනීමට අපොහොසත්වීම පෙන්නුම් කරනුයේ රටේ ආර්ථිකයේ පවතින අස්ථාවරභාවයයි. රාජපක්ෂවරුන්ගේ කොල්ලකාරී හිතවතුන් විසින් විනිමය හා සුරැකුම් කොමිෂම (Securities and Exchange Commision) කොටස් වෙළඳ පොළේ මාෆියාවක් බවට පත්කර ගෙන එය මහා මංකොල්ලයක් බවට පත්කරගෙන තිබෙන බව පසුගිය දිනවල මාධ්‍ය මගින් නිරාවරණය කරන ලදි. මහබැංකු වාර්තාවට අනුව පසුගිය වසරේ ආණ්ඩුවේ ආදායම් හා වියදම් අතර පරතරය රුපියල් බිලියන 285.5 සිට බිලියන 345.5 දක්වා ඉහල ගොස් ඇත. මෙය දළ දේශිය නිෂ්පාදනය හා සැසඳීමේදී සියයට 3.9ක වැඩිවීමකි. ඒ අනුව මෙම වසරේ නොවැම්බරයේ ඉදිරිපත් කිරීමට නියමිත 2014 අයවැය ලේඛණය තව තවත් කම්කරු පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාව මත බර පැටවෙන අයවැයක් වනු ඇත. නියමිත කාලයට වසර දෙකකට පෙර 2014දී හදිසි ජනාධිපතිවරණයක් පැවැත්වීම සඳහා ආණ්ඩුව කැස කවන්නේ ඉදිරියේ මතුවන ආර්ථික අර්බුදය සමග දිගහැරෙන ජනතා විරෝධයට මුහුණදීමට ආණ්ඩුවට නොහැකි වන හෙයිනි.

14 පොදු ජනතාව පාරිභෝජනය කරන සීනි, අල,ලූනු, පරිප්පු, සැමන්ටින්, මාලුවර්ග, හාල්මැස්සන් වැනි දේවලින් අය කරන බදු නිරන්නතරව ඉහළ දමනු ලැබේ. ගොවි ජනතාව ආරක්‍ෂා කර ගැනීම යන ප්‍රෝඩාවට මුවාවී ආණ්ඩුව බදු වැඩිකරන අතර සැබෑ තත්වය වන්නේ බදු ආදායමෙන් සියයට 80ක්ම මහජනතාවගෙන් අයකර ගන්නා බව ජනතාව නොදැන සිටීමයි. මෙම තත්වය ඉදිරියේදී තව තවත් බරපතල වනු ඇත. පොදු රාජ්‍ය මණ්ඩල සමුලුව වෙනුවෙන් වන්දි ගෙවීමට සිදුවන්නේද රටේ ජනතාව ටමය. ඒ වෙනුවෙන් ඇනවුම්කර තිබෙන සුඛෝපභෝගී වාහන ගෙන්වීම සඳහා බදු විශාල සහන සපයාදී ඇති අතර ඉන් අහිමිවන බදු ආදායමද ජනතාව කරමත පත්තකරනු ඇත. පොදුරාජ්‍ය මණ්ඩලය යනු බ්‍රිතාන්‍යය අධිරාජ්‍යයට යටත්ව පාලනයේ පැවැති යටත් විජිත රටවල එකතුවකි. 1940 ගනන්වල ආරම්භක අවධියේ මෙය හැඳින්වුයේ සුදු මිනිසුන්ගේ සංගමය වශයෙන් (white man's club) එම සමුලුවේ ප්‍රධානියා බවට බ්‍රිතාන්‍යයේ මහ රැජින පත්වන්නේ ඒ නිසාය. රටට ඔරොත්තු නොදෙන අධික වියදමක් දරා මෙවැනි සමුලුවක් පැවැත්වීමට රාජපක්‍ෂ පාලනය දරණ උත්සාහය පෙන්නුම් කරනුයේ ඔවුන් තුල පවතින යටත් විජිත මානසිකත්වය බව පැහැදිය. දකුණේ සිංහල ජනතාව නොමග යැවීමට හා රැවටීම සඳහා වරින් වර ව්‍යාජ අධිරාජ්‍යවාදී විරෝධයක් රග දක්වන රාජපක්ෂවරුන්ගේ සැබෑ නිවට අධිරාජ්‍යගැති ස්වරූපය පොදුරාජ්‍ය මණ්ඩලයේ නායක සුමුලුව සාර්ථක කර ගැනීම සඳහා ඔවුන් ඉදිරියේ කරනු ලබන වැඳවැටීම තුලින් ප්‍රදර්ශණය වෙයි.

## පංතිය හා වම

15 නවීන තාක්ෂණය සමග කම්කරු පංතියට ඇතුල්වු නවක තරුණ කම්කරුවන් පැරණි කම්කරු පංතියේ ආකල්ප වලට වඩා වෙනස්ව හිතන පතන බව පැහැදිලිය. එම තත්වය තුල නව කම්කරු පංතිය ආකර්ෂණය කර ගැනීමට සමත් වන්නාවු වැඩ පිළිවෙලක් වෘත්තිය සමිති ක්ෂේත්‍රය තුල නිර්මාණය කර ගැනීම අද අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව තිබේ. නව ලිබරල් ධනේෂ්වර සමාජය තුළ මෙකී කම්කරුවන් අධික සූරාකෑමට ලක්වන බවත් ඊට එරෙහිව සටන් කර වඩා උසස් ජීවන තත්වයක් සහිතව සිය අයිතින් දිනා ගැනීමට තිබෙන හැකියාව ගැන නවක කම්කරු පංතිය තුල විශ්වාසයක් ඇති කිරීම සඳහා වැඩ පිළිවෙලක් අත්‍යවශ්‍යය. එපමණක් නොව මර්ධනයට එරෙහිව නිදහස ප්‍රජාතන්ත්‍රවාදය හා මානව අයිතීන් දිනා ගැනීම සඳහා ජාත්‍යන්තර අත්දැකීම් පෙන්වා දෙමින් ලාංකේය සමාජය තුළ මතුවන පොදු අරගලයන්හිදී නවීන කම්කරුවන් හට සක්‍රිය සාමාජිකයින් ලෙස කටයුතු කිරීමට තිබෙන අවකාශය පෙන්වාදිය යුතුය.

16 1980 වැඩ වර්ජනයෙන් කම්කරු පංති ව්‍යාපාරයට ඇතිකරන ලද පරාජයෙන් ගොඩඒමට හැකියාව තිබෙන ශක්තිමත් එක්සත් කම්කරු පංති ව්‍යාපාරයක් ගොඩනැගීමට නොහැකිවීම පංති ව්‍යාපාරය ඉදිරියේ තිබෙන සැබෑ අභියෝගය වෙයි. නමුත් අවාසනාව වන්නේ මෙම අභියෝගය තේරුම් ගැනීමට සාම්ප්‍රදායික වෘත්තිය සමිති නායකත්වය අසමත් විමය. 1980දී වැඩ වර්ජනය දියත් කිරීමට තරම් එවකට සංවිධාන ශක්තිය මෝරා තිබුනේද නැද්ද යන්න වෙනම සාකච්ජාවට ගතයුතු කාරණයකි. කම්කරු පංති ව්‍යාපාරය හා වමේ ව්‍යාපාරය එකිනෙකට සම්බන්ද වෙන්කළ නොහැකි ප්‍රපංචයන් දෙකක් බව අප කවුරුත් දනිති. සාපේක්ෂ වශයෙන් වමේ ව්‍යාපාරය ද දුර්වල තත්වයක පවතින වකවානුවක මෙම කාරනය තවත් අසීරු කාරනයක් බවට පත්ව තිබේ. 1980ට සාපේක්ෂව වෘත්තිය සමිති තුල සංවිධාන ගතව සිටින කම්කරු පංතිය ප්‍රමානාත්මකව පහළ වැටී ඇත. 1980 වන විට සියයට 25ක වැඩි පමණ ප්‍රමාණයක් සංවිධානගතව සිටි ලාංකේය කම්කරු පංතිය මේ වන විට සියයට 13ක පමණ ප්‍රමාණයක් දක්වා පහල වැටී ඇත. මෙම තත්වය ඇතිවීමට හේතු ගනනාවක් බලපානු ලැබීය. සාම්ප්‍රදායික වමේ නායකයින් වසර 50ක පමණ කාලයක් මුලුල්ලේ අද දක්වා පවත්වා ගෙනයනු ලබන ධනපති සහාග දේශපාලනය මෙම පිරිහීමට මූලික හේතුවකි. පැරණි වමේ නායකත්වය පංති සටන් කෙරෙහි විශ්වාසය තබා ඉල්ලීම් දිනා ගැනීමට යොමුවූ කම්කරු පංතිය ඉන් බැහැර කර ධනපති පංතියේ වලිගයක් බවට පත්කර කම්කරු පංතියේ ස්වාධීනත්වයේ කොන්දකඩා දමන ලදි. එහි තවත් අතුරු ඵලයක් ලෙස ශ්‍රී ලංකා හා එජාප වැනි ධනපති පංතියේ පක්ෂවලට කම්කරුවන් ඩැහැ ගැනීමට අවකාශයක් විවෘත කරන ලද අතර ඒ පිරිස් ධනපති පක්ෂ වල පාලනයේ අතකොලුවක් සේ කටයුතු කරති.

ඒ සමග විවෘත ආර්ථික ක්‍රියාවලිය තුල කම්කරු පංතිය සංවිධානයවීම වැලැක්වීම සඳහා විශේෂ නිති සම්පාදනය කරමින් ඔවුන් නිෂ්ක්‍රීය කිරීම සඳහා වන සැලසුම් සහගත වැඩ පිළිවෙලක් ධනපති ආයෝජකයින් විසින් එජාප හා ශ්‍රීලනිප ධනපති ආණ්ඩුවල සෘජු මැදිහත්වීම මත සිදු කරන ලදි.

17 මෙම තත්වය තුල අලුතෙන් බිහිවු ආයෝජන කෂේත්‍රවල කම්කරු පංතිය තම අයිතීන් දිනා ගැනීම සඳහා සංවිධානගත වීමට තිබෙන හැකියාව දුර්වල තත්වයකට වැටී ඇත. උදාහරණ වශයෙන් ගතහොත් සෞඛ්‍ය අංශයේ වෘත්තිය සමිති පවතින්නේ සෞඛ්‍ය සේවයේ රාජ්‍ය අංශයට සම්බන්ද රෝහල් වල හා එවැනි ආයතනවල පමණී. මේ වන විට රටපුරා විශාල වශයෙන් ව්‍යාප්තව පවතින පෞද්ගලික රෝහල් වල සේවකයෝ එක් සේවා ස්ථානයකවත් වෘත්තිය සමිති තුල සංවිධානය වී නොමැත. ගුරු වෘත්තියද එසේමය. පෞද්ගලික ජාත්‍යන්තර පාසැල් වල ගුරුවරු කිසිම වෘත්තිය සමිතියක සාමාජිකයෝ නොවෙති. මෙම ආයතනවලට කම්කරු ශ්‍රමිකයින් රැකියාවලට ඇතුලත් වන්නේම සංවිධානයවීමේ අයිතිය අහිමිකරන ලද පරිසරයකය. මෙම තත්වය බිඳ දැමීමට හැකිය. එසේ කිරීමට නම් කම්කරු පංති ව්‍යාපාරයේ ප්‍රජාතන්ත්‍රීය ලකෂණ බි!0 දමා ඇති අද පවතින ගතානුගතික ස්වරූපයේ වෘත්තිය සමිති රටාව බිඳදැමිය යුතුය. නව මුහුණුවරකින් වෘත්තිය සමිති අභ්‍යන්තරයේ පවතින ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ජාවන් පෙරට ගෙන කම්කරුවන් හට ඔවුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් තින්දු ගැනීමට දායකත්වය සපයන විවෘත පරිසරයක් නිර්මාණය කළ යුතුය.

18 මේ සියලු තත්වයන් මැද මේ වසරේ මැයි 21 වෙනිදින පැවැති එක්දින සංඛේත වැඩ වර්ජනය වැදගත් ආරම්භයක් විය. 1980 ජුලි වැඩ වර්ජනයෙන් වසර 33කට පසු බිඳවැටුන වෘත්තිය සමිති ව්‍යාපාරය සමිති වශයෙන් හා දේශපාලන වශයෙන් බෙදී පවතින පසුබිම තුල වෘත්තිය සමිති මධ්‍යස්ථාන ගනනාවක් එක්ව කම්කරු පංතියේ පොදු ඉල්ලීම් වෙනුවෙන් එක්සත්ව සටන් තින්දුවක එළැඹීමට හැකිවීම පංතිය ලැබූ ජයග්‍රහණයකි. ධනපති සභාගයේ කොටස්කරුවන් වන පැරණි සමසමාජ හා කොමියුනිස්ට් පක්‍ෂවලට අනුබද්ධ වෘත්තිය සමිති නායකයින් හා ස්වාධින නායකත්වයක් ලෙස පෙනී සිටින සෞඛ්‍ය හා ගුරු වැනි කෂේත්‍රවල කට්ටිවාදී වෘත්තිය සමිති නායකයින් සිදුකළ පාවාදීම් තුල මැයි 21 වැඩ වර්ජනයේ සාර්ථකත්වය අඩු තක්සේරු නොකල යුතුය. දුම්රිය, බස් ප්‍රවාහනය, වරාය, විදුලිය හා තැපැල් යන රාජ්‍ය අංශ වැඩ වර්ජනයට එක්කර ගැනීමට හැකි වැඩ පිලිවෙලක් නොතිබීම වැඩවර්ජනය තුල විශේෂිත දුර්වලකමක් ලෙස දැකිය හැක. මෙම තත්වයට විසදුම් දෙමින් පංති සටන ඊළඟ පියවරේදී වඩා ශක්තිමත්ව දියත් කිරීම සඳහා පියවර ගැනීමට සමිති නායකයින්ට බලකළ යුතුය. එහි ඉතාම වැදගත් පියවරක් වන්නේ වැඩබිම් මට්ටමේ නියොජිතයින්ගෙන් සමන්විත ජාතික සමුලුවක් කැඳවීමට පියවර ගැනීමය. අවස්ථාවාදී සමිති නායකයින්ගේ පාවාදීම් බිඳදමා වැඩ කරන ජනතාව පංති අරගලයට කැඳවා ගැනීමට තිබෙන මාවත වන්නේ වැඩබිම් මට්ටමේ කම්කරුවන්ගේ සමගිය පදනම් කරගත් ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සමුලුවක් ගොඩනගා ගැනීමට කටයුතු කිරීමය.

19 වතුකම්කරු කෂේත්‍රය ලාංකේය කම්කරු පංති ව්‍යාපාරයේ තීරණාත්මක සාධකයකි. සාපේක්‍ෂ වශයෙන් වතු කම්කරු කෂේත්‍රයේ සිටින සියයට 60කට වැඩි ප්‍රමාණයක් වෘත්තිය සමිති තුල සංවිධානයවී සිටී. එසේ වුවද ඉන්දිය සම්භවයකින් පැවත එන තොණ්ඩමාන් වැනි ධනවාදී වෘත්තිය සමිති නායකයින්ගේ ග්‍රහණයෙන් වතු කම්කරු ජනතාව මුදා ගැනීම බරපතල ගැටලුවක් වශයෙන් පවතී. ආණ්ඩු බලය, මුදල් බලය හා මැර බලය යොදාගනිමින් සාපේක්‍ෂ වශයෙන් අඩු අධ්‍යාපනයක් සහිත අඩුදියුණු වතුකරයේ කම්කරුවන් තම ග්‍රහණය තුල රඳවා ගැනීමට මෙම අවස්ථාවාදී නායකයෝ නොකරන දෙයක් නැත. වතු කම්කරු කෂේත්‍රයේ පවතින ධනපති වෘත්තිය සමිති නායකයින්ගේ මෙම ආධිපත්‍ය බිඳ දමා වතු කම්කරුවන් ස්වාධින බලවේගයක් ලෙස සංවිධාන ගත කිරීම සමාජවාදී විප්ලවය ජයගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. කඳුකරයේ තේ වතු කෂේත්‍රය තුළ අපට තිබෙන සීමිත ශක්තිය තෝරාගත් ප්‍රදේශවලට යොමුකර වතු කරයේ දියුණු කම්කරුවන් සමාජවාදී ව්‍යාපාරය වෙත දිනා ගැනීම අපගේ ප්‍රමුඛ කාර්යයක් විය යුතුය. අප අතර සිටින වතුකරයේ සහෝදරවරුන් න්‍යායිකව හා දේශපාලනිකව සන්නද්ධ කිරීමට කෙටි කාලින වැඩපිළිවෙලක් සකස් කර ගැනීමද අපගේ ආසන්න ඉලක්කයක් විය යුතුය.

## ජාතික ප්‍රශ්නය

20 සියලු වර්ගයේ අවස්ථාවාදීන්ට, සුළු ධනේෂ්වර විකාර බහුබූත මතවාදයන්ට එරෙහිව ජාතික ප්‍රශ්නය අරඹයා ඉතා දුෂ්කර පරිසරයක නිර්ව්‍යාජ මාක්ස්වාදී ස්ථාවරයක් මත පිහිටා කටයුතු කළ එකම සංවිධානය වන්නේ එක්සත් සමාජවාදී පක්‍ෂය පමණී. ජාතින්ගේ ස්වයංනිර්ණය අයිතිය වෙනුවෙන් මාක්ස්වාදී ස්ථාවරය මත පිහිටා කටයුතු කරන විට ජාතින්ගේ ස්වයංනිර්ණය අයිතිය යන්නෙහි ඇත්තේ එකම එක අර්ථයක් බවත් එනම් ස්වාධින වෙනම රාජ්‍යයක් ඇති කිරීමට දෙමළ ජාතියට තිබෙන අයිතිය පිළිගැනීම බව අපි දිගින් දිගටම පෙන්වා දී ඇත්තෙමු. පීඩිත ජාතියකට වෙන්වීම සඳහා තිබෙන අයිතිය සඳහා පෙනී නොසිටින තමන් සමාජවාදීන්යැයි කියා ගන්නා පිරිස් සැබෑ සමාජවාදීන් නොව සමාජද්‍රෝහි ජතිවාදීන් යැයි ලෙනින් ප්‍රකාශ කලේ මෙය තේරුම්කර දීම සඳහාය. 2009 මැයි මාසයේදී LTTE සංවිධානය යුද්ධමය වශයෙන් පරාජය වීමෙන්

පසුව ලංකාවේ ජාතික ප්‍රශ්ණය පෙර තිබුනාටත් වඩා සංකීර්ණ තත්වයකට පත්ව ඇත. ජාතික ගැටලුව දුර්වල ලාංකේය ධනෙෂ්වරයට විසඳුම් දිය නොහැකි බව ඉතිහාසය පුරාවට සනාත කර ඇත. එසේම ජාතික ගැටලුවට සමාජවාදයේ ගැටලුවක් නොවන බව පෙන්වා දිය යුතු අතර අපවැනි රටවල අඩුදියුණු ධනපති නායකත්වය විසින් ජාතික ප්‍රශ්නය හිතාමතාම අවුලට පත් කරමින් සිටින බව පැහැදිලිය.

21 දෙමළ ජනතාවගේ ජාතික ගැටලුව විසදා ගැනීමේ අරගලය මේ අනුව මුලු මහත් ලාංකේය කම්කරු පංතිය හා වැඩ කරන දුගී ජනතාව ධනේෂ්වර ක්‍රමයට එරෙහිව ගෙනයන සටන හා බැඳී පවතී. එම අරගලය අනිවාර්‍යයෙන් සමාජවාදී වැඩ පිළිවෙලක් මත පදනම් වන ධනපති විරෝධී අරගලයක් විය යුතු අතර දෙමළ ජනතාවගේ ස්වයංනිර්ණය අයිතිය ඇතුලු ජාතික පීඩනය නිසා ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න ඊට අන්තර්ගත විය යුතුය. දෙමළ ජනතාව එම අරගලය කම්කරු පංතියෙන් බැහැරව වෙනම අරගලයක් ලෙස ගෙන යාමෙන් විමුක්තිය උදාකරගත නොහැකි බව 30 අවුරුදු යුද්ධය කියාදෙන කටුක පාඩම වන්නේය. එබැවින් දෙමළ ජනයා ඉදිරියේ අද පවතින තත්වය නම් දෙමළ භාෂාව කථාකරන උතුරේ දෙමළ ජනතාව හා නැගෙනහිර මුස්ලිම් ජනතාව කම්කරු පංතිය හා වමේ ව්‍යාපාරය හා එක්ව ධනපති පාලනය හා ධනෙෂ්වර ක්‍රමය අහෝසි කිරීම සඳහා ගෙනයන අරගලයේ කොටස්කරුවන් බවට පත්වීමය. එසේ නොමැතිව ධනපති විරෝධී අරගලයෙන් හුදකලාව ගෙනයන වැඩ පිළිවෙලකින් දෙමළ ජනතාවගේ විමුක්තිය උදාකරගත නොහැකිය.

22 දෙමළ ජාතික සන්ධානයේ (TNA) ධනපති නායකත්වය දෙමළ ජනතාවගේ ජාතික අරගලය දිනා ගැනීමට කටයුතු කරන්නේ ඉන්දියානු ධනපති නායකයින්ගේ පිහිටෙන් බව ඔවුන් විසින්ම කියනු ලැබේ. මෙය සමස්ථ දෙමළ ජනතාවගේ ජාතික විමුක්තිය සහමුලින්ම පාවාදීමකි. එසේම දෙමළ සන්ධාන නායකත්වය ධනවාදී හා ජාතිවාදී රාජපක්ෂ රෙජිමයට එරෙහිව සටන් වදින දකුණේ කම්කරු පංතිය හා පීඩිත ගොවි ජනතාවගේ අරගලය හා අත්වැල් බැඳ ගැනීමට සුදානම් නැත. උතුර හා දකුණ ඒකාබද්ධවූ එවැනි අරගලයක් නිර්මාණය වන්නේ නම් එය දෙමළ ජාතික සන්ධානයේ නායකයින්ගේ ධනපති සීමාවන් බිඳගෙන ධනපති විරෝධී නව සමාජයක් ගොඩනැගීමේ දිසාවට අනිවාර්යයයෙන්ම ගමන් කරනු ඇත. උතුරේ පලාත් සභා ජන්දයේදී ජාතිවාදී හා ධනවාදී රාජපක්ෂ පාලනය පරාජය කිරීම අනිවාර්‍ය මෙන්ම වැදගත් වර්ධනයකි. එහෙත් එය හුදු දකුණේ පලාත් සභාවන් මෙන්ම ධනේෂ්වර සීමාවතුල පැලපදියම් වන ස වෙනත් මාදිලියක දෙමළ ධනපති පලාත් සභාවකින් ඔබ්බට ගමන් නොකරනු ඇත. දකුණු ඉන්දියාවේ ටැමිල්නාඩුවේ අපි අත්දකිනුයේ එම යථාර්ථයයි. ටැමිල්නාඩු ප්‍රාන්තයේ කරුණානිධිගේ හෝ ජෙයලලිතා දෙමළ මහ ඇමතිවීමෙන් ටැමිල්නාඩුවේ දුක් විඳින ලක්ෂ සංඛ්‍යාත කම්කරු පංතිය ඇතුලු පීඩිත ජනතාව අත්කරගත් සුගතියක් නැත.

23 යුද්ධ පරාජයෙන් ඇතිවූ අති විශාල බලපෑම උතුරේ දෙමළ සමාජය තුල තවමත් පවතී. ඒ අතර යුද්ධයෙන් පසුව උතුරේ පවත්වගෙන යන මිලිටේරි පාලනය දෙමළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රිය අයිතීන් උදුරා දමා ඇත. තවමත් උන්හිටිතැන් අහිමිවූ පවුල් විශාල ප්‍රමාණයක් සිටින අතර ඔවුන්ගේ පාරම්පරික ඉඩම් හමුදාව විසින් බලහත්කාරයෙන් අල්ලාගෙන ස්ථිර හමුදා කඳවුරු බිහි කිරීමට පියවර ගෙන ඇත. උතුරේ දෙමළ ජනතාවගේ නායකත්වයෙන් පළාත් සභාවක් පිහිටුවීමට ඉඩකඩ ඇති නමුත් දෙමළ ජනතාව මුහුණදෙන සමාජ ආර්ථික හා දේශපාලන ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමට දෙමළ පලාත් සභාව අසමත් වන බව අපි පෙන්වාදී ඇත. ඒ අතර විදේශගතව ජීවත්වන දෙමළ ඩයස්පෝරාව උතුරේ ජනතාවගේ කැමැත්ත තීන්දු කිරීම සඳහා ජනමත විචාරණයක් (Referendam) පවත්වන ලෙසට උද්ඝෝෂණයක් ගෙනයමින් සිටී. බැලූබැල්මට යුක්ති සහගත බව පෙනෙන මෙවැනි සටන්පාඨ විදේශ ගත දෙමළ ප්‍රජාවට ඉදිරිපත් කිරීම පහසුය. එහෙත් යුද්ධ පරාජයේ වේදනාවලින් පීඩාවිදිමින් හමුදා සපත්තුවට යටකරගෙන සිටින උතුරේ දෙමළ සමාජය තමන්ගේ ජාතික නිදහස හා විමුක්තිය දිනා ගැනීමේ අරගලය සඳහා යොමු කිරීම වියුක්ත සටන්පාඨ වලින් සිදුකල හැකි කාර්‍යයක් නොවේ. එය කළ හැකි වන්නේ ජාතික ප්‍රශ්නය හා බද්ධකර ගත් උතුරේ හා දකුණේ කම්කරු පංතිය සමග අත්වැල් බැඳගත් සමාජවාදී වැඩ පිළිවෙලක් පෙරදැරි කරගත් ධනපති විරෝධී අරගලයක් සමගය.

24 අප තේරුම් ගත යුතු වන්නේ ධනේෂ්වර ක්‍රමය තුල ජාතික ප්‍රශ්නයට විසඳුම් ලබාගත නොහැකිවා මෙන්ම දුගී බාවයට හා විරැකියාවට විසඳුම් ලබාගත නොහැකි බවයි. ධනපති ප්‍රජාතන්ත්‍රිය විප්ලවයේ නිම නොවූ ප්‍රශ්නයක් වශයෙන් පවතින ජාතික ගැටලුවට ස්ථිර විසඳුමක් ඉදිරිපත් කළ හැකි වන්නේ කම්කරු පංතියේ නායකත්වයෙන් ගොඩනගන සමාජවාදී පාලනයකට පමණී. දෙමළ ජනතාවගේ ජාතික ගැටලුව හුදු පාර්ලිමේන්තු සීමාවන් තුල සිදු කරන රාජපක්ෂ වෙනුවට එජාපය බලයට පත්කරන ආණ්ඩු වෙනස්වීමකින් විසදාගත නොහැකිය. එබැවින් වර්තමාන රාජපක්ෂ පාලනයට මෙන්ම ධනපති එක්සත් ජාතික පක්ෂයට එරෙහිව ගෙනයනු ලබන අරගලය තුලින් වමේ විප්ලවකාරී ආණ්ඩුවක් ගොඩනගා ගැනීම සඳහා සටන් වැදීම අත්‍යවශ්‍යය. එවැනි විප්ලවකාරී ආණ්ඩුවක් ගොඩනගා ගැනීම සඳහා යන ගමනේ පළමු පියවර වන්නේ ධනපති විරෝධී ස්වාධීන කම්කරු පංතියේ පක්ෂයක් ගොඩනගා ගැනිමය. එනම් එක්සත් සමාජවාදී පක්ෂය ගොඩනැගිමට උතුරේ නැගෙනහිර මෙන්ම කඳුකරයේ දෙමළ භාෂාව කථාකරන ජනතාව ඒකරාශිවීමය.
එවැනි විප්ලවකාරී විසඳුමක් කරා ගමන් කිරීම ජාතික දේශපාලන තලයට සීමාවී කල හැකි දෙයක් නොවේ. එය දෙමළ ජනතාවගේ ජාතික විමුක්තිය දිනා ගැනීම පමණක් නොව සමස්ථ ගොවි කම්කරු පීඩිත ජනතාවගේ

විමුක්තිය දිනා ගැනීම පිළිබඳ අරගලයේ කොටසකි. එවැනි වැඩ පිළිවෙලක් ජයගත හැකි වන්නේ ආසන්න වශයෙන් ඉන්දිය උප මහද්විපය තුල නිර්ධන පංතිවිප්ලවයේ දිගහැරීම තුල පමණී. දකුණු ඉන්දියාවේ පීඩිත ජනතාව ඇතුලු සමස්ථ ඉන්දියානු කම්කරු පංතිය හා පීඩිතයින් ආමන්ත්‍රණය කරන වැඩ පිළිවෙලක් වෙනුවෙන් දෙමළ භාෂාව කථා කරන ජනතාව දිනා ගැනීම අපගේ ප්‍රමුඛතම කාර්යය වනු ඇත.

## ඉදිරි අභියෝග

25 වර්තමාන තරුණ පරම්පරාව අත්දකිනුයේ ලාංකේය සමාජය ගෙවීගිය දශක තුනකට නොඅඩු කාලයක් තිස්සේ ගමන් කළ අතිවිශාල ලේ වැගිරීම් හා මිනී කඳු වල ඉතිහාසයයි. එම පරිසරය තුළ ධනේෂ්වර පාලනය ජාතිවාදී නායකත්වයක් තුල සාමාන්‍යයෙන් පැවතිය යුතු තත්වයෙන් පවා පිරිහීමකට ලක්ව විකෘති තත්වයකට පත්විය. එම තත්වය වෙනස් කිරීමේ උවමනාවක් සිංහල බෞද්ධ ධනපති පාලකයෙකු ලෙස රාජපක්ෂ පාලනයට නොතිබූ අතර භිෂණය තවදුරටත් ව්‍යාප්ත කරමින් පාලනය කිරිම ඔහුගේ උවමනාව විය. පශ්චාත් යුද්ධ ශ්‍රී ලංකාවේ රාජපක්ෂ පාලනයේ පැවැත්ම ආරක්‍ෂා වී තිබෙන්නේ සිංහල බෞද්ධ රාජ්‍යයට අභියෝගයක් එල්ලවන බව නැවත පෙන්වා නැගී එන සෑම ජනතා අරගලයක්ම හමුදාව යොදා මර්ධනය කිරීමය. පසුගිය අගෝස්තු මස 1 වන දින රතුපස්වල වැලිවේරියේදී සිදුකළ හමුදා ඝාතනවලින් එය දකුණේ ජනතාවට තහවුරු කර පෙන්වන ලදී. කම්කරුවන්ගේ ශිෂ්‍යයන්ගේ හෝ ගොවියන්ගේ හෝ වේවා මතුවන සෑම අරගලයක්ම විදේශ අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයකින් සිදුවන බව පෙන්වීම ආණ්ඩුවේ එකම සූත්‍රය බවට පත්ව ඇත. රාජපක්ෂ රෙජිමය මේ වන විට යුද්ධ හමුදාව ඔවුන්ගේ පවුල් පාලනය ආරක්‍ෂා කිරීමේ පුද්ගලික හමුදාවක් බවට පත්කර ගෙන ඇත. උග්‍ර වෙමින් පවතින සමාජ ආර්ථික හා දේශපාලන ප්‍රශ්න වලින් දකුණේ සමාජය කළඹවන විට රාජපක්ෂවරුන්ගේ ආරක්‍ෂාවට අන්තිමට සිටිනුයේ හමුදාව පමණී.

26 මේ වන විට ලංකාවේ බිහිවෙමින් පවතින්නේ ඇෆගනිස්ථානය වැනි රටවල පවතින මුස්ලිම් මූලධර්මවාදයට නොදෙවෙනි බෞද්ධ මූලධර්මවාදයයි කිව හොත් එය අතිශයෝක්තියක් නොවේ. පසුගිය දිනවල රටේ නොයෙකුත් ප්‍රදේශවල බෞද්ධ අන්තවාදීන් විසින් නීතිය තමන් අතට ගෙන මුස්ලිම් ආගමික ආයතනවලට, වෙළඳ ව්‍යාපාරවලට, විවිධ රාජ්‍ය නොවන සංවිධානවලට එරෙහිව ගෙන ගිය ප්‍රචණ්ඩ ක්‍රියා වලින් ඒ බව පැහැදිලිව පෙනේ. රාජපක්ෂ පාලනය එකී නිති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමෙන් පෙනී යන්නේ ජාතික හෙළ උරුමය බොදු බල සේනා හා සිංහල රාවය, රාවණා බලය වැනි පැසිස්ට් පන්නයේ සංවිධාන වලට රාජ්‍ය අනුග්‍රහය නොඅඩුව ලැබෙන බවය. මෙය යුද්ධයේ ජයග්‍රහණය තුලින් බිහිකර ගන්නා ලද සිංහල ආධිපත්‍යවාදයේ තර්කානුකූල අවසානයයි. යුද්ධය සඳහා දකුණේ සැලසුම් සහගතව ගෙනගිය ඊනියා දේශප්‍රේමී ව්‍යාපෘතිය මේ වන විට කම්කරු පංතිය ප්‍රමුඛ සියලු පීඩිත බලවේග වලට එරෙහිවද සෙසු සියලූ ආණ්ඩු විරෝධී දේශපාලන ව්‍යාපාරවලට එරෙහිවද යෙදා ගනිමින් එය සිංහල බෞද්ධ ස්වෝත්තමවාදය ස්ථාපිත කරන්නක් දක්වා ගමන් කර ඇත. ත්‍රස්තවාදයට එරෙහි සටන් පාඨ යොදා ගනු ලැබුවේ ඒ වෙනුවෙනි. රාජපක්ෂ විසින් ව්‍යාවස්ථාදායක ඒකාධිපතිත්වයක් ගොඩනගා ගනිමින් ඊට එරෙහිව නැගී එන ජනතා විරෝධය මර්ධනය කිරීම සාධාරණය කිරිම සඳහා පරාජය කරනු ලැබූ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයේ සෙවනැලි නැවත ඔසවා විරුද්ධවාදීන්ට  කොටි ලේබල් ඇලවීමට නැවත කටයුතු කරමින් සිටී.

27 මේ සියලු තත්වයන් මධ්‍යයේ රාජපක්ෂ ආණ්ඩුවේ අධිරාජ්‍යගැති නවලිබරල් ආර්ථික වැඩ පිළිවෙල විවිධ ක්ෂේත්‍රවල යම් ප්‍රමාණයකට හෝ අභියෝගයට ලක් කිරීමට කම්කරු පංතිය හා ගොවි ජනතාව ප්‍රමුඛ පීඩිත ජනතාවට හැකිවීම ජයග්‍රහණයකි. ඒකාබද්ධ ජනතා අරගලයක් වශයෙන් රාජපක්ෂ පාලනයට එරෙහිව සංවිධානගත නොවුවද පොහොර සහනාධාරය කපා දැමීමට එරෙහිව රටපුරා ඇත විවිධ ප්‍රදේශ වල රාජපක්ෂට සහයෝගය දුන් දුප්පත් ගොවි ජනතාව කැරලි ගසන්නට විය. රුපියල් 350ක සහනාධාර වශයෙන් දුන් පොහොර සහනය ඉවත් කිරීමත් විශාල පොහොර හිඟයක් නිර්මාණය වීමත් ඊට හේතුවිය. අධ්‍යාපන කප්පාදුවට හා විශ්ව විද්‍යාල පුද්ගලීකරණයට එරෙහිව විශ්ව විද්‍යාලවල  සිසුන්ගේ අරගල මැඩ පැවැත්වීමට මිලිටේරි බලය යොදා විශ්ව විද්‍යාල භූමිය හමුදා බැරැක්ක බවට පත්කර ගෙන ඇත. විශ්ව විද්‍යාල සිසුන් දහස් ගණනකගේ පංති තහනම් කර ශිෂ්‍ය භාවය අවලංගු කිරීමට පියවර ගෙන ඇතත් මර්ධනය නොතකා ශිෂ්‍යයින්ගේ අරගලය නොකඩවා දිග හැරෙමින් පවතී. කොළඹ නගරය විදේශික ජාවාරම්කාරයින්ගේ සූදු තිප්පොලක් බවට පත් කිරීමට ආණ්ඩුව ගෙන තිබෙන පියවර සමග කොළඹ නගරයේ වසර ගනනාවක් ජිවත්වූ අඩු ආදායම් ලාභී දුගී නිවාස හා පැල්පත් බලහත්කාරයෙන් කඩාබිඳ දමා ඔවුන් නගරයෙන් ඉවත් කිරීමට කටයුතු කරමින් සිටී. එයට විරුද්ධව දුගී ජනයාගේ අරගලය නායකත්වයකින් තොරව අඛණ්ඩව දිග හැරෙමින් පවතී. එසේම ලක්‍ෂ හයක් පමණ (600000) වන ත්‍රිරෝද රථ රියදුරන්ගේ රැකියාවල පැවැත්ම අහෝසි කිරීමට ආණ්ඩුව විවිධ නීති පනවමින් සිටී. මහා පරිමාන ව්‍යාපාරිකයින්ට ඉඩ සැලසීම සඳහා කොළඹ නගරයෙන් ත්‍රිරෝද රථ ඉවත් කිරීමට කටයුතු කිරීම ආණ්ඩුව ගෙන යන ඊනියා ආසියාවේ ආශ්චර්යය ගොඩනැගීමේ තවත් පියවරකි. එම තත්වයට විරුද්ධ ත්‍රිරෝද රථ රියදුරන් දීප ව්‍යාප්ත අරගලයකට සූදානම් වෙමින් සිටී. මෙකී ජන කොටස් රාජපක්ෂ දිනවීම වෙනුවෙන් විශාල වශයෙන් සහභාගිවූවන් බවද තේරුම් ගැනීම වැදගත්ය. රත්නපුර කහවත්ත ප්‍රදේශයේ ආණ්ඩුවට සම්බන්ද ප්‍රාදේශිය දේශපාලඥයින් විසින් සිදුකරන ලද ඝාතනවලට එරෙහිව මෙන්ම රාජපක්ෂ පාලනයට සම්බන්ද දේශපාලඥයින් අය විසින් සිදුකරන දූෂණ හා ඝාතනවලට එරෙහිව ජනතාව සාධාරණ පරීක්ෂණ ඉල්ලා මිනීමරුවන්ට දඩුවම් දෙන ලෙස ඉල්ලා වීදි

උද්ඝෝෂණ වල නිරත විය. මොරටුව ප්‍රදේශයේ වඩු කාර්මිකයෝ තමන්ට සිදුව ඇති අසාධාරණයන්ට එරෙහිව ඇමති ජීවන් කුමාරතුංගට එරෙහිව විශාල උද්ඝෝෂණයක් ගෙනගියහ. දැරණියගල, ලග්ගල, ආණමඩුව, පොළොන්නරුව, මහියංගණය, අනුරාධපුරය, දඹුල්ල, මාතලේ වැනි ප්‍රදේශවල ජනතා සිය දහස් ගනනින් මර්ධනය නොතකා උද්ඝෝෂණය කරමින් තම ඉල්ලීම් අර්ධ වශයෙන් ජයග්‍රහණය කිරීමට සමත් විය.

28 විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ අරගලය (FUTA) හුදු වැටුප් වැඩිකර ගැනීමේ අරගලයකින් ඔබ්බට ගොස් නව ලිබරල් ආර්ථික වැඩ පිළිවෙල තුල විනාශයට යමින් තිබෙන නිදහස් අධ්‍යාපනය රැක ගැනීමේ ජනතා අරගලයක් බවට පත්විය. එම අරගලය ආණ්ඩුවේ දඹ්බර ප්‍රතිපත්තිය තාවකාලිකව හෝ පසු බැස්සවීමට සමත් විය. රාජ්‍ය අනුග්‍රහය මත ඉදිකර තිබෙන කම්හලකින් නිකුත් වන රසායනික අපද්‍රව්‍ය පසට කාන්දුවීම නිසා වැලිවේරිය ප්‍රදේශයේ ලිං ජලය අපවිත්‍රවීමට එරෙහිව ජනතාව ගෙනගිය අරගලය මැඩ පැවැත්වීම සඳහා මිලිටේරිය විසින් තරුණයින් පිරිසක් ඝාතනය කරන ලදී, ඊට එරෙහිව දකුණේ විවිධ ප්‍රදේශවල ජනතාව අඛණ්ඩව උද්ඝෝෂණයන්ට යොමු වෙමින් ආණ්ඩු විරෝධී අරගලය පෙරට ගෙන යමින් පවතී. මෙම සිදුවීම් පෙන්නුම් කරනුයේ දකුණේ සිංහල සමාජය මර්ධනකාරී පාලනය නොතකා රාජපක්ෂ පාලනයේ සමාජ ආර්ථික ක්‍රියාවලිය අභියෝගයට ලක්කරන ජනතා අරගල ප්‍රවනතාවයක් මතුවෙමින් පවතින බවය. ශක්තිමත් වමේ ව්‍යාපාරයක් හා කම්කරු පංති ව්‍යාපාරයක් පවතින්නේ නම් මෙලෙස තැනින් තැන මතුවන හුදකලා අරගල වලට නායකත්වයක් සැපයිය හැකි වන්නේය. මෙම තත්වය පෙන්නුම් කරනුයේ රාජපක්ෂ පාලනය අර්බුදයට ගමන් කිරීම සමග කම්කරු පංතිය, ශිෂ්‍ය ව්‍යාපාරය හා පීඩිත ජනතාව තුලින් ආණ්ඩු විරෝධී අරගලය මුවහත් වන බවය. විප්ලවවාදීන් වශයෙන් අප වෙත පැවරෙන අතිශය භාරදූර වගකීම වන්නේ මෙම තත්වයට මැදිහත් විය හැකි කේඩර්ගත විප්ලවාදී පක්ෂයක් ගොඩනැගීමය.

29 පුලුල් අර්ථයෙන් වමේ ව්‍යාපාරය ගැන සලකා බැලීමේදී පසුගිය වසර තුල ප්‍රධානතම සිදුවීම වුයේ ජනතා විමුක්ති පෙරමුණ දෙකඩවී ජන අරගලව්‍යාපාරය බිහිවී ඉන් අනතුරුව පෙරටුගාමී සමාජවාදී පක්ෂය බිහිවීමය. ජවිපෙය තුළ ආරම්භවූ මෙම විවාදය වැදගත් වර්ධනයක් ලෙස සලකා එහි ආරම්භයේ සිටම අප පක්ෂය ඔවුන් සමග න්‍යායික සාකච්ජාවකට මැදිහත් විය. පෙරටුගාමී පක්ෂය ජවිපෙයට සාපේක්ෂව වම දෙසට ගමන් කිරීමක් වන අතර ජවිපෙය ආරම්භයේ සිට අනුගමනය කළ වාම විරෝධී කට්ටිවාදී රෝගයෙන් වෙන්වී වමේ ව්‍යාපාරය හා සම්පව කටයුතු කිරීමේ ප්‍රවනතාවයක් ආරම්භක අවධියේදී ප්‍රදර්ශණය කරන ලදී. ඇත්ත වශයෙන් පෙරටුගාමීන් ජවිපෙන් වෙන්වුයේ ජවිපෙය පරිවාසය නමින් අනුගමනය කල පංති සහයෝගිතාවාදී දේශපාලනය පාවාදීමක් බව තේරුම් ගැනීම සමගය. ජනාධිපතිවරණයේදී රාජපක්ෂ බලයට පත් කිරීමට හා හිටපු හමුදාපති සරත් පොන්සේකාට දෙවන වටයේ ජනාධිපතිවරණයට සහයෝගය දීම හේතු කොට ගෙන ජවිපෙ පහල ක්‍රියාකාරීන් අතර විශාල කළකිරීමක් ආරම්භවී තිබුණි. ජවිපෙය අනුගමනය කල පංති සහයෝගිතාවාදී පිරිහීමට එරෙහිව පෙනී සිටියද පෙරටුගාමීන්ගේ අභිප්‍රාය වුයේ විජේවීර සමයේ සිට ගලා එන සිංහල ජාතිකවාදී මූලයන් ආරක්ෂා කරමින් වඩා සුපිරිසිදු ජවිපෙයක් ගොඩනැගීමටය. එහෙත් එම උත්සාහය තුල ඔවුන් අතරමං වී ඇත.

30 එනිසාම පෙරටුගාමීන් ආරම්භයේ සිටම පරස්පර වලින් යුක්තවූ ඉදිරිමග ගැන අවිනිශ්චිත බාවයක් පෙන්වූ සටන්කාමී තරුණ ව්‍යාපාරයක් විය. සිංහල ගැමි සමාජය පදනම් කරගත් රැඩිකල් තරුණ ව්‍යාපාරයකට ජාතික ප්‍රශ්ණය සම්බන්දයෙන් සංවයංනිර්ණ අයිතිය පිළිගැනීමේ මාක්ස්වාදී ආස්ථානය වෙත ලගාවීම කෙසේ වෙතත් කම්කරු පංති නායකත්වයෙන් සමාජවාදී ව්‍යාපාරය ගොඩනැගීම ගැන ලෙනින්වාදී සංකල්පය ගැන පවා විචිකිජ්ජාවක් ඇත. එම තත්වය තේරුම් ගනිමින් එහෙත් පෙරටුගාමී පක්ෂය සමග එක්ව කම්කරු පංතියට හා පීඩිත ගොවි ශිෂ්‍ය ව්‍යාපාරයට නායකත්වයක් දිය හැකි ලාංකේය වමේ ව්‍යාපාරය ගොඩනැගීම ගැන ඉදිරි දර්ශණයක් හා වැඩ පිළිවෙලක් ගොඩනගා ගැනීමට අප දරණ ලද උත්සාහය අසාර්ථක විය. ඒ වෙනුවට පෙරටුගාමීන් අනුගමනය කලේ මතුපිට තලයේ සිදුවීම් සමග හුදු ප්‍රදර්ශණාත්මක ක්‍රියාවන්ට සීමාවීමය. ඇත්ත තත්වය නම් කම්කරු පංති නායකත්වයෙන් වමේ ව්‍යාපාරය ගොඩනගා ගැනීම සඳහා වන දුෂ්කර සංවාදයක් ආරම්භ කිරීමට පෙරටුගාමීන් උවමනාවක් නොවීය.

31 මේ වන විට එම පක්ෂය අභ්‍යන්තරයේ අර්බුද ගනනාවක් මතුවී තිබීම පෙන්නුම් කරනුයේ අප ඉහත දැක්වූ ගැටලු විසඳා ගැනීමට පෙරටුගාමී පක්ෂයේ නායකත්වය අපොහොසත් වීමේ ගැටලුවයි. එසේ වුවද පෙරටුගාමී පක්ෂය සමග ඉදිරි ගමනක් අපේක්ෂාවෙන් ජවිපෙන් වෙන්වූ සටන්කාමී තරුණ හා ශිෂ්‍ය බලවේගයට අප රටේ වමේ ව්‍යාපාරය ගොඩනැගීමේ සාකච්ජාවේදී වැදගත් කාර්යභාරයක් හිමිවනු ඇත. එම තරුණ බලවේගය ධනපති විරෝධි සමාජවාදී බලයක් වෙනුවෙන් කාලය හා ශ්‍රමය පුජාකල පිරිසකි. නිවැරදි ඉදිරි දර්ශණයක් මත වමේ ව්‍යාපාරයක් ගොඩනැගීමට අපොහොසත් වන්නේ නම් ඔවුන් විශ්වාස බංගත්වයට පත්ව ධනපති ක්‍රමය තුල නිෂ්ක්‍රියවීමේ අනතුර අප ඉදිරියේ ඇත. පැරණි වම ගැන ඔවුන් ලබා තිබෙන අම්හිරි අත්දැකීම් වල ඉතිහාසයක් තුල එම තරුණ පිරිස් සමග මාක්ස්වාදී න්‍යායික සාකච්ජාවන් ගෙනයමින් ඔවුන් විප්ලවවාදී ව්‍යාපාරය වෙත දිනා ගැනීම බොහෝ වෙහෙසකර එහෙත් මගහැරිය නොහැකි අභියෝගයකි. ඒ සමග වමේ ව්‍යාපාරය ගොඩනැගීම සඳහා සංයුක්ත වැඩ පිළිවෙලක් මත එක්සත්ව කටයුතු කිරීමට නසසපය සමග අප ගත් උත්සාහයද පලරහිත විය. නසසපයේ නායකත්වය සමාජවාදය ගොඩනැගීම කෙරෙහි පැවැති සියලු බලාපොරොත්තු අතහැර දමා තිබීම ඊට හේතුවයි. එම පක්ෂයේ නායකත්වය වමේ ව්‍යාපාරය

ගොඩනැගීම අත්හැර දමා ඒ වෙනුවෙට සමාජප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක ස්වරූපයේ ධනපති දේශපාලනය සමග කටයුතු කරමින් සිටින බව දකින්නට හැකිය.

32 අපි ගමන් කරමින් සිටිනුයේ දකුණේ සිංහල බෞද්ධ අධිපතිමතවාදය පදනම් කරගත් ව්‍යවස්ථාදායක ඒකාධිපතිත්වයක් තහවුරු කරමින් සිටින අවධියකය. කම්කරු පංතිය හා පීඩිත ජනතාවගේ ප්‍රජාතන්ත්‍රිය අයිතීන් උදුරා දමමින් මිලිටේරි පාලනයක් රටතුල ස්ථාපිත කරමින් සිටී. රාජයේ පාසැල්වල විදුහල්පති වරුන්ට හමුදා පුහුණුවක් ලබාදී කර්නල් තනතුරු ප්‍රධානය කර ඇත. එම විදුහල්පතිවරු හමුදා නියෝග අනුව කටයුතු කළ යුතු බව එයින් ප්‍රකාශවේ. 2011 අගෝස්තුවේ නිකුත් කළ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව සෑම දිස්ත්‍රික්කයකම හමුදා ආරක්ෂක කඳවුරු පිහිටුවීමට අවශ්‍ය පරිසරය සකසා ඇත. බොහෝ ආයතනවල රජයේ සිවිල් පරිපාලන කටයුතු සඳහා ආරක්ෂක හමුදා ප්‍රධානීන් හෝ විශ්‍රාමික හමුදා නිලධාරීන් පත්කර ඇත. ජාත්‍යන්තර බලපෑම් ඉදිරියේ හදිසි නිතිය ඉවත් කරනු ලැබූවද ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (PTA ) යටතේ හදිසි නීතිය යටතේ කරනු ලැබූ සියලු කාර්‍යයන් සිදුකර ගෙන යනු ලැබේ.

33 මෙම තත්වයට මුහුණ දිය හැකි එකම බලවේගය වන්නේ තරුණයින් සිසුන් හා දුගී ගොවීන් සමග ගොඩනැගෙන සංවිධානාත්මක කම්කරු පංතියේ බලයයි. එහෙත් පැරණි වමේ ව්‍යාපාරය සහාග දේශපාලනය හරහා කම්කරු පංතියට ඇතිකරන ලද විනාශයෙන් ගොඩඒමට තවමත් නොහැකිවී ඇත. ඉතිහාසය විසින් අපගේ දෙවුර මත රඳවා තිබෙන දැවැන්ත ඓතිහාසික කාර්යභාරය ධනපති සභාග දේශපාලනයට හා ජාතිවාදයට එරෙහිව ස්වාධින කම්කරු පංතියේ බහුජන පක්ෂයක් ගොඩනැගීමය. ඒ කරා අප යන ගමන සරළ හෝ පහසු එකක් නොවන බව පසුගිය ඉතිහාසය පෙන්වා දෙනු ලබයි. ජාතිවාදයෙන් හා යුද්ධවාදයෙන් සිහිවිකල් කරගත් පැසිස්ට් තාලයේ සමාජ බලවේග වල තර්ජන ඉදිරියේ අප සමාජවාදයේ රතු ධජය බිම දැමීමට ඉඩ නොදී රැකගෙන ගමන් කළෙමු. ඒ දුෂ්කර ගමනේදී අපගේ විරෝධාර සගයින්ට ජීවිත පූජා කිරීමට පවා සිදුවිය. නමුත් සමාජවාදී සමාජයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය වන ස්වයංබද්ධ සාධකය වන විප්ලවවාදී පක්ෂය ගොඩනැගීම සඳහා වන අපගේ අධිෂ්ඨානය හා කැපවීම නතර කිරීමට කිසිවෙකුට නොහැකිය.

34 මෙම පසුබිම තුල ධනපති පක්ෂ සමග පවා අපට නුහුරු නුපුරුදු උද්ඝෝෂණික කටයුතු වල යෙදීමට අපට සිදුව ඇත. මර්ධනය ඉදිරියේ පොදු ආණ්ඩු විරෝධී ක්‍රියාකාරකම් වල නිරතවීමට අපට සිදුව ඇත්තේ ඒ අනුවය. අධිරාජ්‍යගැති ධනපති එක්සත් ජාතික පක්ෂය සමග පවා අපට එක වේදිකාවක පෙනී සිටීමට මහපාරේ එක්සත් උද්ඝෝෂණවල මර්ධනයට හා පීඩනයට එරෙහිව පෙනී සිටීමට සිදුව ඇත. එසේ වුවද එජාපයේ හෝ කිසිම ධනපති පක්ෂයක් සමග එක්සත් සමාජවාදී පක්ෂය කිසිම ආකාරයේ සන්ධාන ගතවීමක් නොකරනු ඇත. රාජපක්ෂ රෙජිමය වෙනුවට එජාපය බලයට පත් කිරීමෙන් ලාංකේය සමාජය මුහුණදෙන ගැඹුරු සමාජ ආර්ථික ප්‍රශ්න වලට විසඳුම් ගබාගත නොහැකි බව අප නැවත නැවත අවධාරණය කරමින් සිටින්නෙමු. පසුගිය කාලය තුල මැතිවරණ ක්ෂේත්‍රයේදී වමේ ස්වාධිනත්වය අරඹයා සන්ධානයට හා එජාපයට යන පක්ෂ දෙකටම විරුද්ධව අප පක්ෂය වෙනම තරඟ කිරීම තුලින් පෙන්නුම් කලේ එයයි. ආඥාදායක රාජපක්ෂ පාලනය ගෙනයන මර්ධනයට හා අභියෝග වලට මුහුණදීම පහසු කටයුත්තක් නොවේ. සමාජයට වග නොකියන කට්ටිවාදීන්ට විවේචනයන් කරමින් හුදකලාව සිටිය හැකි වුවත් එයින් ඒකාධිපති මර්ධනයට මුහුණදිය නොහැකි බව තේරුම් ගත යුතුය. අප පක්ෂයේ සංවිධාන ශක්තිය විශාල නොවුවද අප ජාතික මට්ටමේ දේශපාලනය හා බද්ධවී කටයුතු කරන තත්වයක් දක්වා වර්ධනයවී ඇත. සැබැවින්ම අපගේ ශක්තියට වඩා අප වෙත ලැබෙන ප්‍රචාරය අපේ ශක්තිය අතිශයෝක්තියට ලක්වීමකි. එක්සත් සමාජවාදී පක්ෂය ගැන සඳහන් නොවන ජාතික දේශපාලන කටයුත්තක් නොවන ප්‍රමාණයට අප ජාතික තලයේ ප්‍රසාදයක් දිනගෙන ඇත. මේ අසමාන වර්ධනය තේරුම් ගනිමින් අප තරුණ කම්කරුවන් ශිෂ්‍යයන් දිනාගනිමින් පක්ෂයේ සංවිධානාත්මක ශක්තිය වර්ධනය කර ගැනීම ඉදිරි අභියෝගවලට මුහුණදීම සඳහා අවශ්‍ය පියවර ගතයුතුය.

35 අද පවතින ප්‍රතිගාමී හා පසුගාමී තත්වය සදාකල් පවතින එකක් නොවන බව තේරුම් ගත යුතුය. සමාජ ආර්ථික ප්‍රශ්න වඩා උග්‍ර තැනකට පත්විම සමග ජාතිවාදී ආගම්වාදී පසුගාමී දේශපාලන පදනම් පුපුරුවාගෙන සමාජ අර්බුදය ඉදිරියට පැමිනෙනු ඇත. දැනටමත් ලාංකේය සමාජය තුල හා කම්කරු පංති ව්‍යාපාරය තුල අනාගත නැගිටීම් වල ලක්ෂණ දැකිය හැකි බව මෙම ලියවිල්ලෙන් පෙන්වා දි ඇත. රාජපක්ෂවරු ගොඩනගමින් තිබෙන සියලු බලකොටු හා පවුරු ඉදිරියේ මතුවන අර්බුදය ඉදිරියේ වැල්ලේ තැනූ මාලිගාවන්සේ දියවී යනු ඇත. ලෝකයේ විවිධ කලාප වල විවිධ රටවල ජනතා නැගිටීම් වලින් ජන අරගල අද යුගයේ ජීවමාන ක්‍රියාවලියක් බව පෙන්වාදී තිබේ. සැතපුම් හෝ කිලෝ මීටර් වලින් අප ඒ ජනතා නැගිටීම් සිදුවූ රටවලට වඩා දුරින් ජීවත් වුවද අප එම ජනතා නැගිටීම් වලට ඉතා ආසන්න තැනකට පත්වෙමින් සිටී. ඒ අනුව අප ඇතුල් වෙමින් සිටින්නේ ඉතා සුළු සිදුවීමකින් බරපතල වෙනස්කම් 'සිදුවීමට හැකි සමාජ අවකාශයක බව අවධාරණය කරගත යුතුය. ජාත්‍යන්තරවාදීන් වන අපි කම්කරු ජාත්‍යන්තරයක් සඳහා කමිටුවේ (CWI ) සාමාජිකයන් වෙමු. ලොවපුරා රටවල් 45ක් තුල ලෝකයේ සියලු මහාද්වීප තුල අපි ජාත්‍යන්තරයක් වශයෙන් සංවිධානයවී සිටින්නෙමු. CWI ජාත්‍යන්තරයේ දේශිය ශාඛාව ලෙස අපි එහි මගපෙන්වීම් හා ඉදිරි දර්ශණය හා ක්‍රියාමාර්ග මත පදනම්ව කටයුතු කරන අතර විශේෂයෙන් ඉන්දු උප

මහාද්වීපයේ සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කිරීම වෙනුවෙන් ආසන්න වශයෙන් බැඳී සිටී. 1940 ගනන් වල (දේශපාලන වශයෙන් පිරිහීමට පෙර) සමසමාජ පක්ෂයේ ආරම්භක කාලයේ පැවැති ඉන්දිය බොල්ෂේවික් ලෙනිනිස්ට් පක්ෂය ගොඩනැගීමේ අදහසට සමීපව අපි කටයුතු කරමින් සිටිමු.

17 අගෝස්තු 2013